

# දිළිඳුකමින් රට මුදාගැනීමේ සංග්‍රාමය

**එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එල කරන ලද නිර්වචනයට අනුව දිළිඳුකම යනු ආහාර, පානීය ජලය, ඇඳුම් පැළඳුම්, නිවාස, මූලික අධ්‍යාපනය හා ප්‍රාථමික සෞඛ්‍ය පහසුකම් ආදී මූලික අවශ්‍යතා පවා අහිමි වීමයි. සාමාන්‍යයෙන් දිළිඳුකම හඳුනාගත හැකි ආකාර දෙකක් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තවදුරටත් විග්‍රහ කර ඇත, එනම් නිරපේක්ෂ දරිද්‍රතාව හා සාපේක්ෂ දරිද්‍රතාවයි. නිරපේක්ෂ දරිද්‍රතාව යනු ඉහත කී මූලික මානව අවශ්‍යතාවන් දැඩි ලෙසින් අහිමි වීම තුළින් ඇතිවන තත්ත්වයකි. නමුත් යම් පුද්ගලයෙකුගේ හෝ පවුල් ඒකකයක පවත්නා තත්ත්වය ඔවුන් ජීවත්වන සමාජයේ වෙනත් පුද්ගලයෙකුට හෝ පවුල් ඒකකයන්ට සාපේක්ෂව දිළිඳු යැයි සලකනු ලබන්නේ නම් එය සාපේක්ෂ දරිද්‍රතාවයි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනීමේ මූලිකම ඒකකය වන්නේ ජාතික දරිද්‍රතා රේඛාවයි. දරිද්‍රතා රේඛාව යනු කිසියම් රටක ප්‍රමාණවත් යැයි සැලකෙන අවම ආදායම් මට්ටමයි. දරිද්‍රතා රේඛාව සාමාන්‍යයෙන් ගණනය කරනු ලබන්නේ සාමාන්‍ය වැඩුණු මිනිසෙකු වසරක් තුළ පරිභෝජනය කරනු ලබන සියලුම අත්‍යවශ්‍ය සම්පත් වල සියලුම පිරිවැය ගණනය කරනු ලැබීමෙනි.**

ආචාර්ය
**ඩබ්ලිව්. කේ. කොළඹගේ**

තිස් වසරක ශාපලත් යුද්ධයක කටුක අත්දැකීම විඳි ශ්‍රී ලාංකිකයන්ට එය නිමා වී දශකයක පමණ කාල සීමාවක් ගතවන වර්තමානයේ දිළිඳුකම තුරන් කිරීම නමැති සංග්‍රාමයට මුහුණ දීමට සිදුව තිබේ. එදා මෙදා තුර පටන් පැවති, 'ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක්' යන ලේබලය ඉවත් කර, රටවැසියන්ට දිළිඳු බවින් තොර, සැප පහසු දිවියක් උදා කර දීම අලුතින් පත්ව ආ නව රජයට ඇති ප්‍රධානම අභියෝගයකි. එහි දී දේශීය දැනුම හා සම්පත් භාවිත කරමින් දේශීය කර්මාන්ත නඟා සිටුවීමට කටයුතු කිරීම නව රජය ආරම්භයේ දීම ගත් ප්‍රගතිශීලී ක්‍රියාමාර්ගයකි. මෙම උපාය මාර්ග ගැඹුරින් අධ්‍යනය කළ විට බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක වී සියලුම ජනතාවගේ ජීවන අවශ්‍යතා සපුරාලීම වෙත අවතීර්ණ වීමට අවශ්‍ය මූලික පියවරයන් ගැනීමට රජය කටයුතු කර ඇත. එමගින් සියලු ආර්ථික මට්ටම්වලට අයත් ජනයාට රටේ සමස්ත ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ ඉදිරියේ දී අත්විඳීමට හැකි වනු ඇත. එහෙත් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක වන මහා පරිමාණ සංවර්ධන හෝ දරිද්‍රතාව තුරන් කිරීමේ ව්‍යාපෘති වුවත් ඒවා සියලුම ජනතා කණ්ඩායම් වෙත ඵලදායීව ළඟා නොවන්නේ නම් එය තවදුරටත් පුස්සක් වීමට ඉඩ තිබිණි.

1995 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එල කරන ලද නිර්වචනයට අනුව දිළිඳුකම යනු ආහාර, පානීය ජලය, ඇඳුම් පැළඳුම්, නිවාස, මූලික අධ්‍යාපනය හා ප්‍රාථමික සෞඛ්‍ය පහසුකම් ආදී මූලික අවශ්‍යතා පවා අහිමි වීමයි. සාමාන්‍යයෙන් දිළිඳුකම හඳුනාගත හැකි ආකාර දෙකක් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තවදුරටත් විග්‍රහ කර ඇත, එනම් නිරපේක්ෂ දරිද්‍රතාව හා සාපේක්ෂ දරිද්‍රතාවයි. නිරපේක්ෂ දරිද්‍රතාව යනු ඉහත කී මූලික මානව අවශ්‍යතාවන් දැඩි ලෙසින් අහිමි වීම තුළින් ඇතිවන තත්ත්වයකි. නමුත් යම් පුද්ගලයෙකුගේ හෝ පවුල් ඒකකයක පවත්නා තත්ත්වය ඔවුන් ජීවත්වන සමාජයේ වෙනත් පුද්ගලයෙකුට හෝ පවුල් ඒකකයන්ට සාපේක්ෂව දිළිඳු යැයි සලකනු ලබන්නේ නම් එය සාපේක්ෂ දරිද්‍රතාවයි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනීමේ මූලිකම ඒකකය වන්නේ ජාතික දරිද්‍රතා රේඛාවයි. දරිද්‍රතා රේඛාව යනු කිසියම් රටක ප්‍රමාණවත් යැයි සැලකෙන අවම ආදායම් මට්ටමයි. දරිද්‍රතා රේඛාව සාමාන්‍යයෙන් ගණනය කරනු ලබන්නේ සාමාන්‍ය වැඩුණු මිනිසෙකු වසරක් තුළ පරිභෝජනය කරනු ලබන සියලුම අත්‍යවශ්‍ය සම්පත් වල සියලුම පිරිවැය ගණනය කරනු ලැබීමෙනි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් වසර පහකට පමණ වරක් පවත්වනු ලබන සමීක්ෂණය මත පදනම්ව දරිද්‍රතා රේඛාවට පහතින් සිටින ජන ප්‍රතිශතයක් ගණනය කරනු ලබයි. දරිද්‍රතා රේඛාවට පහතින් සිටින ජන ප්‍රතිශතය දිළිඳු ජනගහන අනුපාතයයි. 2016 වන විට ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 4.1% ජාතික දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වූහ. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේනතුවට අනුව රටේ වඩාත්ම දුගී සමාජ ආර්ථික කණ්ඩායම වනුයේ කෘෂිකාර්මික නොවන ශ්‍රමිකයන් හා ඒ හා සමාන කම්කරුවන් මූලිකත්වය දරන ගෘහ ඒකකයන්ය. අස්ථාවර ආදායම් මාර්ග, එදාවේල උපයා ගන්නා ආහාර රටාව මෙන්ම මත්ද්‍රව්‍ය හා මත්පැන් වලට ඇබ්බැහි වීම ආදිය ඒ සඳහා බලපාන ප්‍රධානම හේතු සාධකයි. දරිද්‍රතාව හා මත්ද්‍රව්‍ය, මත්පැන් වලට ඇබ්බැහි වීම අතර ඇත්තේ අනුලෝම සහසම්බන්ධතාවකි. බොහෝවිට ස්වාමියාගේ මත්ද්‍රව්‍ය හා මත්පැන් වලට ඇබ්බැහි වීම හේතුවෙන් සොච්චම් මුදලකින් පවුලෙහි සියලුම කටයුතු කිරීමට සිදු වේ. ඔවුන් සතුව ඇත්තේ බහුමානීය දරිද්‍රතාවකි. දිළිඳු පවුල් විශේෂයෙන්ම සමස්ත ආදායමෙන් 60% ආහාර සඳහා වැය කරන නමුත් ඔවුන්ගේ දවසේ පෝෂණ අවශ්‍යතාවයෙන් අවම වශයෙන් 80% තරම්වත් නොලබයි.

ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු සුබසාධන සේවාවන් විශාල වශයෙන් රට තුළ ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව ආහාර සහනාධාරය, නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවාවන් ආදී සුබසාධන සේවාවන් රැසක් පැවති ආණ්ඩු විසින් පවත්වා ගෙන ගියද ආර්ථික දරිද්‍රතාවට හේතුවන විරැකියාව, ඌණ සේවා නියුක්තිය, ඉඩම් අහිමි බව, පහළ ආදායම් මට්ටම හා පහළ ජීවන තත්ත්වය වැනි සමාජ ආර්ථික ගැටලු සඳහා එමගින් ස්ථිරසාර විසඳුමක් නොලැබිණි. ඒ අනුව නිදහස ලැබීමෙන් පසු කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරන ලද දිළිඳුකම පිටුදැකීමේ ප්‍රයත්න විවෘත වෙළෙඳපොළ ප්‍රතිපත්තියට පෙර හා විවෘත වෙළඳපොළ ප්‍රතිපත්තියට පසු ලෙස හඳුනාගත හැකිය.

විවෘත වෙළඳපොළ ප්‍රතිපත්තියට පෙර දිළිඳුකම පිටු දැකීමේ ප්‍රයත්න ලෙස වී වගාව ග්‍රාමීය ආර්ථිකය මත පදනම කරගැනීම, ඒ වටා ග්‍රාමීය ආර්ථිකය ගොඩ නැංවීම කෙරේ අවධානය යොමු කිරීම සහ වාරිමාර්ග හා ජනපද ව්‍යාපාර සඳහා විශාල වශයෙන් මුදලක් යෙදවීම දැකිය හැක. මීට අමතරව ඉඩම් අහිමි පුද්ගලයන්ගේ පදිංචිය සඳහා රජයේ ඉඩම් හා රජයට පවරා ගන්නා ලද පෞද්ගලික ඉඩම් ලබා දීම විවිධ ඉඩම් යෝජනා ක්‍රම හරහා සිදුවිය. 1970 වර්ෂයේ ආරම්භ වූ මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය මේ යටතේ සිදු කරන ලද සාර්ථක ව්‍යාපෘතියකි. තවද වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පොහොර සහනාධාරය හඳුන්වා දීම, කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම හා බහුතර ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික ණය ලබා දීම ද එවක රජයන් විසින් ගනු ලැබූ පියවරයන් වේ.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව තුරන් කිරීමට හිතකර වැඩසටහන් කෙතරම් ආරම්භ කරන ලද නමුත් එම වැඩසටහන් අදාළ ඉලක්ක ජය ගත් බවට වර්තමාන තත්ත්වයන් සාක්ෂි නොදරයි. සමහර වැඩසටහන් දිළිඳු ජනතාවගේ ආර්ථික තත්ත්වය වර්ධනය කිරීමට කිසිදු උනන්දුවක් නොදැක්වූ නමුත් එම ජනතාවගේ එදිනෙදා ජීවිතය පවත්වාගෙන යෑමට පමණක් උපකාරී විය. 1950 සහල් කූපනයක් ද ඒ වෙනුවට 1979 ආහාර මුද්දරය ද ලබා දීම වැනි වැඩසටහන් ඊට කදිම නිදසුන්ය.

විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දීමත් සමඟ ශ්‍රී ලංකාවේ නිෂ්පාදකයන්ට ඉතා සංවර්ධිත දියුණු නිෂ්පාදනයක් සමඟ තරග කිරීමට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ප්‍රාථමික නිෂ්පාදන වැසී ගිය අතර ඒ අනුව රටේ විරැකියා ගැටලුව, විශේෂයෙන් ග්‍රාමීය අංශයෙහි දරිද්‍රතා ගැටලුව පෙර නොවූ විරූ තරමට ඉහළ ගියේය. ඒ අනුව රටේ දරිද්‍රතාව ඉහළ නැංවීම පාලනය කිරීම සඳහා ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීමට රජයට සිදු විය. එසේ ගත් ක්‍රියාමර්ග ලෙස වෙනස් කිරීමේ ඒජන්තවරයාගේ වැඩසටහන (Change Agent Programme -CAP) යටතේ ප්‍රජා ශක්ති සංවිධාන පිහිටුවා එහි සාමාජිකයන් සඳහා ග්‍රාමීය ණය වැඩසටහන් හා පුහුණු වැඩසටහන් පැවැත්වීම; ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති (1979-1989) යටතේ වාරි කර්මාන්ත, පොල් සංවර්ධන, කෘෂිකර්මාන්තය, පශු සම්පත්, ග්‍රාමීය පාරවල්, ජල විදුලිය ආදිය ග්‍රාමීය මට්ටමින් සංවර්ධනය කිරීම; සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධනය (1980-1982) යටතේ ගමේ මානව සම්පත හා ඔවුන් සතු භෞතික සම්පත් වලට අනුව ගම්වැසියන් නිෂ්පාදනශීලී අන්දමින් සංවිධානය කිරීම; ජනසවිය ව්‍යාපෘතිය (1989-1995) යටතේ නිෂ්පාදනයෙන් තොර වූ ශ්‍රමය ස්වයං රැකියා මඟින් ශ්‍රම බළකායට එක් කිරීම ආදිය දැක්විය හැක. සමෘද්ධි වැඩසටහන ද (1995 - අද දක්වා) එසේ ක්‍රියාත්මක වන තවත් වැඩසටහනක් වන අතර ඒ යටතේ ආදායම් පැවරීමේ වැඩසටහන, සමෘද්ධි බැංකු ක්‍රමයේ ක්ෂුද්‍ර ණය වැඩසටහන හා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වේ.

විවෘත ආර්ථිකය තුළ එමඟින් ඇති වන ප්‍රතිඵල ඉහළ සිට පහළට විහිදී යෑම තුළින් දුප්පත්කම පිටු දකී යයි විශ්වාස කළ ද ආර්ථික පරිණාම ක්‍රියාවලිය තුළ එය තවදුරටත් යථාර්ථයක් වී නොමැත. එහිදී ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ඒකාබද්ධ වීමකට වඩා ආර්ථික සංවර්ධනය හා වැඩිවන රැකියා හිඟය එකිනෙකට පටහැනි ආකාරයෙන් පැවතීම සිදු විය. දරිද්‍රතාව දූෂණය, අස්ථාවරත්වය, නීතිය සාමය හා විනය කඩ




වීම කෙරෙහි ද බලපායි.

රජය මේ වන විටත් සුබසාධන සේවාවන් පුළුල් කරනවාට වඩා නැඟී එන තරුණ ව්‍යවසායකයන් හට අවශ්‍ය මූල්‍ය හා අනෙකුත් ශක්තීන් ලබා දෙමින් ඔවුන් දිරි ගැන්වීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඇත. විශේෂයෙන්ම නිදහස් අධ්‍යාපනයෙන් බිහි කරන උපාධිධාරියා තුළින් රැකියා ඉල්ලා උද්ඝෝෂණය කරන්නෙක් වෙනුවට ඔවුන් තුළ ඇති ශක්තීන් ඉස්මතු කර ස්වාධීනව ගොඩ නැඟී සිටිය හැකි ඵලදායී උපාධිධාරියෙක් තුළින් සාර්ථක ව්‍යවසායකයන් නිර්මාණය කිරීම හා ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන පසුබිම නිර්මාණය කිරීම ද රජයේ මූලික ප්‍රතිපත්තීන් බව වර්තමානයේ රජය ගන්නා තීන්දු තීරණ ඔස්සේ ගම්‍ය වේ. එමෙන්ම දේශීය ආර්ථික හා දේශීය ව්‍යාපාර කෙරෙහි ලිහිල්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් නව ව්‍යාපාර සවිබල ගැන්වීමක් තුළින් වැඩිවන රැකියා හිඟයට ද විධිමත් විසඳුමක් ලබා දීමටත් කටයුතු කරන බව හැඟීයයි.

කෙසේ වුවත් රජයක් ලෙස ගතහැකි ක්‍රියාමර්ගවල සාර්ථකත්වය නිර්ණය වන්නේ ඒවා කෙතරම් මට්ටමකට සමාජගත වනවාද යන්න මතයි. දරිද්‍රතාව පිටු දැකීමට ගන්නා ක්‍රියාමාර්ගවල සාර්ථක බව ඇති කිරීම පොදු මහජනතාව වන අපි සියලු දෙනාගේම ද ඒකායන අරමුණ හා වගකීම බව අප සියලු දෙනා අවබෝධ කරගත යුතුය. ඔබට මාළු අවශ්‍ය වූ කල, මාළු බෑමට බිලී පිත්තක් ලැබුනොත් එය භාවිත කර මාළු බාගැනීම වෙනුවට තවමත් අපිට මාලු ලැබුණේ නැතැයි කියා බිලී පිත්තද ඇතැතිව කෑ මොර දෙන්නේ නම් එය ඔබ සිදු කරන වැරැද්දකි. මාළු බෑමට නොදන්නා කෙනෙක් වුවත් මාළු බෑමට දන්නා කෙනෙකුට බිලී පිත්ත දී ඔබත් ඔහුත් සමග එක්ව අවශ්‍යතාව සපුරා ගැනීමට උත්සුක වීම වර්තමානයේ අප රටේ සමාජය තුළ ගොඩනගා ගත යුතු මානසික මට්ටම වේ.